රාජ්‍ය පරිපාලන ~~චක්‍රලේඛ අංක:~~ 129

මගේ අංකය: 2/9/771(එච්).
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7. 1978 ඔක්තෝබර් මස 5 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙතටයි,

1978 සැප්තැම්බර් මස 28 වෙනි දින සංකේත
වැඩ වර්ජනය.

---

අංක. 126 හා 78.09.15 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර සේවය අත්හළ සේ සැලකෙන නිලධාරියකු හෝ සේවකයකු, 78.09.28 වැනි දින තමන් නොපැමිණීම ගැන සෑහෙන කාලයක් තුළදී නිදහසට කරුණු ඉදිරිපත් කරයි නම්, එබඳු කරුණු ඉදිරිපත් කිරීම් සාමාන්‍යයෙන් සලකා බලන බලධාරියාට, ඒ ගැන සලකා බලා එසේ සේවයට නොපැමිණීමට හේතුවල නිර්ව්‍යාජත්වය ගැන තමන් ගේ තීරණයෙන් සෑහීමට පත්වන්නේ නම්, 78.09.28 වැනිදා සිට යළි සේවයට පැමිණීම අතර කාල සීමාව තුළ වැටුප් රහිතව තබමින්, එම නිලධාරියාට/සේවකයාට යළිත් සේවයට පැමිණීමට අවසර දිය හැක.

Siriwardhana
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු.
අමාත්‍යාංශයේ ලේකම්.